•

# කිරිනැලියේ කැඩුම් බිඳුම්, ගෙඩි වණ හා කෙරමිණියේ සර්වාංග වෛදකම

පාරම්පරික වෛද්‍ය ඇස්. ප්‍රේමදාස


පාරම්පරික උරුමයක් වන කැඩුම් බිඳුම් වෙදකම හා ගෙඩි වෙදකමත්, කෙරමණියේ වෙද හාමුදුරුවන්ගෙන් උගත් සර්වාංග වෙදකමත් ඇසුරෙන් ලත් දැනුමෙන් හා කර්මාභ්‍යාසයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි අම්බලන්තොට  ප්‍රදේශයෙහි රෝගීන් සඳහා මාගේ ප්‍රතිකාර පද්ධතීන් යොදා සාර්ථක ප්‍රතිඵල මා විසින් අත් කර ගෙන ඇත.

රෝගියා පරීක්ෂා කිරීමෙන් අනතුරු ව රෝගී ආඝාත තත්ත්වය පලපුරුද්දෙන් ආඝාතය වූ අවස්ථාවේ ම නම් මා හට හඳුනා ගැනීමට හැකියාව පවතින අතර දින ගණනක් පසු වූ විට ඉදිමුම ආදී ප්‍රදාහ ලක්ෂණ පහළ වූ විට ං- කිරණ ඡායාරූප ආදී නවීන තාක්ෂණික දැනුම ද භාවිත කරමින් මා විසින් රෝගී තත්ත්වය හඳුනා ගැනීම සිදු කෙරේ. අනතුරු ව අප පරම්පරාවෙන් පැවත එන හන්දි රාජ තෛලය නම් ඖෂධීය කොළ වර්ග රාශියක එකතුවෙන් සකසන ලද  විශේෂිත කැඩුම් බිඳුම් තෙල අභ්‍යංග කර අප පරපුර සතු ව පවතින කැඩුම් බිඳුම් සඳහා විශේෂිත මන්ත්‍ර මැතිරීම සිදු කරනු ලැබේ. අවශ්‍යතාවය අනුව පතුරු භාවිතය හා වෙලුම් යෙදීම ද සිදු කෙරේ. මෙලෙස දින තුනක් තෙල් බැඳීමෙන් අනතුරු ව රෝගය සුව වන ආකාරය පරීක්ෂා කර අවස්ථානුකූල ව  ප්‍රතිකාර පද්ධතිය තීරණය කරනු ලැබේ.

අනතුරුව හල්දුම්මල ඇතුළු විශේෂිත දේශීය ඖෂධ අඹ තෙල් වලින් අඹරා සකසන ලද පැලැස්තරයක් (චකීඑැර) පතුරු තබා දින 07කට හෝ දින 14කට ඇලවීම සිදු කරනු ලැබේ. මෙම විශේෂිත පැලැස්තරය අප පරම්පරාව සතු විශේෂිත ප්‍රතිකාර ක්‍රමයකි.

මීට අමතරව ගෙඩි වණ වෙදකම සැලකූ විට අප පරම්පරාව සතු ව ගෙඩි මතුවේගෙන එන අවස්ථාවල එය පැසවීමට පෙර ඉහිර යාමට විශේෂිත හල්දුම්මල ඇතුළු විශේෂිත ඖෂධවලින් සකසන ලද පැලැස්තර (චකීඑැරි) පවතී. ඒවා ඇලවීමෙන් එම ගෙඩිය ඉහිරී යාම සිදුවේ. පැස වූ අවස්ථාවල නම් එය පිපිරී යාමට දී සැරව ඉවත් කර බෙහෙත් මඟින් තුවාල සුව වීමට සලසයි. ශල්‍ය කර්ම නිර්දේශිත රෝගීන් පවා මා ඉතා පහසුවෙන් මෙම ප්‍රතිකර්ම ක්‍රම මඟින් සුව කර ඇත.

මාවනැල්ලේ කෙරමණියේ වෙද රෝහලේ වෙද හාමුදුරුවන්ගෙන් සර්වාංග වෙදකම පිළිබඳ ව ප්‍රායෝගික පුහුණුව ද සහිත ව අධ්‍යාපනය ප්‍රගුණ කළ ද අංශභාග රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමට විශේෂිත නැඹුරුවක් මා සතුව පවතී.